# සක් දෙවිඳුගේ විකාශය

බටහිර විද්‍යාඥයන්ගේ කුහකකම් අධිපතිවාදීකම් කෙසේ වුවත් ඇතැමුනට දෙවියන් පෙනෙන බව අපි විශ්වාස කරමු. මා හඳුනන එක්තරා කාන්තාවකට ද දෙවියන් දැකගත හැකි ය. එපමණක් නොව ඒ ඒ දෙවිවරුන්ගේ නම් ද ඇය දනියි. ඒ දෙවිවරු ඇය හමුවීමට පැමිණෙන අතර ඇතැම් දෙවිවරුන් මාර්ගයෙන් ජනතාවගේ කයට හා අධ්‍යාත්මයට වෙදකම් කිරීමට ද ඇයට හැකි ය. ඒ පිළිබඳ අත්දැකීම් මට ද ඇත. මා සිතන අයුරින් නම් ඈ හමුවීමට පැමිණෙන්නේ එකම දෙව් පිරිසකි. සමහරවිට ඇයට සම්බන්ධකම් පැවැත්වීමට හැක්කේ සීමිත දෙව් පිරිසක් සමඟ විය හැකි ය.

ඇගේ ස්වාමි පුරුෂයා ද වරක් දෙකක් දෙවියන් දැක ඇත. එමෙන් ම ඒ නිවසට පැමිණි දෙතුන් දෙනකු ද දෙවියන් දැක ඇතැයි කියැවෙයි. මා ඒ කිසිම දෙව් කෙනකු දැක නැතත් ඒ අය දෙවියන් දැක ඇති බව පිළිගැනීමට මට කිසිම අපහසුවක් නැත. ඒ ඇතැම් දෙවිවරු කලින් කියන ලද කාන්තාව මගින් ජනතාවට සිංහල නිල වෙදකම හා සිංහල ගොවිකම පිළිබඳ දැනුම ද ලබා දෙයි. කෘමි නාශක හෝ රට පොහොර හෝ නොයොදා කුඹුරු කිරීම සම්බන්ධයෙන් අප කලින් ද දැන සිටි දෑ ඒ දෙවිවරු තහවුරු කරති.

එකී කාන්තාව හා දෙවියන් දැක ඇති කිහිප දෙනා දෙවියන් දැක ඇත්තේ පන්සල්වල දෙවියන් චිත්‍රගත කර ඇති ආකාරයෙන් ය. මෙහි දී යමකුට කිව හැක්කේ ඒ දෙවියන් දැක ඇතැයි හා දකින්නේ යැයි කියන පුද්ගලයන් පන්සල්වල තමන් දැක ඇති දේව රූප සිතින් මවාගෙන භ්‍රාන්තියකට හෝ මෝහනයකට හෝ පත්වී තමන් පන්සල්වල දැක ඇති ආකාරයෙන් දේව රූප දකින්නේ යැයි ප්‍රකාශ කළ හැකි බව ය. ඇතැම් අයකු එලෙස භ්‍රාන්තියකට පත්විය හැකි නමුදු දෙවියන් දකින සියලු දෙනා එවැන්නවුන් යැයි කිව හැකි නො වේ.

පැරණි සිංහල නිල වෙදකම (සිංහල වෙදකම් කිහිපයක් තිබෙන්නට ඇතැයි ද නිල වෙදකම ඉන් එකක් පමණක් යැයි ද සිතිය හැකි ය. මෙයින් අදහස් වන්නේ ඒ විවිධ වෙදකම් අතර සම්බන්ධයක් නොතිබූ බව නො වේ. ඒ වෙදකම් එකිනෙක පෝෂණය කරන්නට ඇත. සිංහල බෞද්ධ ක්‍රමය එය වෙයි.) ගැන කිසිවක් නොදන්නා කාන්තාවක් කිසිම මෝහනයකට පත් නොවී දැන් දෙවියන් බවට පත් වී සිටින පැරණි සිංහල වෙද මහතුන්ගේ දේව භව සමග දිනපතා ම මෙන් කෙරෙන සන්නිවේදනයෙන් දැන ගන්නා බෙහෙත්වලින් රෝගීන් සුවපත් කිරීමත් රෝග විනිශ්චය හා ප්‍රතිකාර ශිෂ්‍යයන්ට කියා දීමත් කිසිසේත්ම භ්‍රාන්තියකට ලඝු කිරීමට නො හැකි ය. ඇය රෝගීන්ට ප්‍රතිකාර කරන්නේත් ශිෂ්‍යයන්ට උගන්වන්නේත් ප්‍රකෘති ස්වරූපයෙන් මිස මෝහනයකට හෝ භ්‍රාන්තියකට හෝ වෙනත් එවැනි මානසික තත්වයකට හෝ පත් වී නො වේ. එසේ ම ඇය කිසිවක් නොදන්නා ගොවිකම ගැන ද එලෙස ම දෙවියන්ගෙන් දැනගන්නා කරුණු සීමිත පිරිසකට කියා දෙන්නී ය.

ඇය ඉතා පැහැදිලිව දේව රූප විස්තර කරයි. ඇයට ඒ ඒ දෙවියන් වෙන්කර හඳුනාගත හැකි නමුදු ඒ සියළු දෙවිවරුන්ට පොදු ඇඳුම් පැලඳුම් වෙයි. අවශ්‍ය නම් එයට දෙවියන්ගේ නිල ඇඳුම යැයි කිව හැකි ය. ඒ නිල ඇඳුමෙහි ඔටුන්නක් ඇත. ඒ ඔටුන්න සාමාන්‍ය රජ කෙනකු පළඳින ඔටුන්නක් වැන්නක් නො වේ. දෙවියන් පලඳින ඔටුන්න කේතුවක ස්වරූපයක් ගනියි. දෙවියන්ගේ ඇඳුම් රෙදි (සළු) මිස මුට්ටු කරන ලද රෙදි නොවේ යැයි කිව හැකි ය. සාරිය යනු රෙද්දක් මිස මුට්ටු කරන ලද ගවුමක් හැට්ටයක් වැනි ඇඳුමක් නො වේ. මෙහි දී මුට්ටු කරන ලද වස්ත්‍රයක් යන්නෙන් අදහස් කෙරෙන්නේ රෙදි කැබලි එක්කර සකස් කරගන්නා ලද වස්ත්‍රයක් ම නො වේ. මුට්ටු කිරීමෙන් පසුව වස්ත්‍රය තවදුරටත් රෙද්දක ආකාරයෙන් නොතිබිය යුතු ය යන්න එයින් අදහස් කෙරෙයි.

උදාහරණයක් වශයෙන් ගතහොත් භික්ෂූන් වහන්සේ පොරවන සිවුර කැබලි එක්කර සකස් කෙරෙන්නෙකි. එහෙත් එය රෙද්දක ආකාරයෙන් පවතියි. එහෙත් සරමක් යනු මුට්ටු කර සකස් කෙරෙන වස්ත්‍රයකි. සරමක් තවදුරටත් රෙද්දක ආකාරයෙන් නො පවතියි. එහෙත් වේට්ටියක් හෝ ජාතික ඇඳුමෙහි කොටසක් වූ රෙද්ද හෝ රෙද්දක් ආකාරයෙන් ම පවතියි. ගණිතමය භාෂාවෙන් කියන්නේ නම් රෙද්දක් ද්විමානයෙහි සෘජු කෝණාස්‍රයක්, වෘත්තයක්, ත්‍රපීසියමක් වැනි තල වස්තුවකට ස්ථලවිද්‍යාත්මක ව (topologically) තුල්‍ය වෙයි. සරමක් තුල්‍ය වන්නේ සිලින්ඩරයකට ය.

© Prof. Nalin De Silva

දේව රූප අජන්තා චිත්‍ර අතර ද දැකගත හැකි ය. ඒ රූප අතර ඉන්ද්‍ර නම් යක්ෂයකුගේ රූප ද වෙයි. ඉතා පැහැදිලිව ම ඉන්ද්‍ර යනු යක්ෂ ගෝත්‍රිකයන්ගේ වැඳුම් පිදුම්වලට ලක් වූ දේව භවයක උපන් මළ යක්ෂ නායකයකු හෝ යක්ෂ ගෝත්‍රිකයන් කිහිප දෙනකුට පෙනුනු දෙවි කෙනෙකි. ඉන්ද්‍ර යනු එවැනි දෙවිවරුන් අතර ප්‍රධානියා වූ බව ද පැහැදිලි ය. කලින් ද සඳහන් කෙරී ඇති පරිදි ඉන්ද්‍ර, ඉඳු ආදියෙන් නායකයා යන්න ගම්‍ය වෙයි. යක්ෂ ගෝත්‍රිකයන්ගේ දෙවිවරුන් යන සංකල්පය ඔවුන් ඉරානය හෝ අසල ප්‍රදේශයක හෝ ජීවත් ව සිටිය දී ඇති වන්නට හැකි යැයි සිතේ. එහෙත් පසුව ආර්‍ය නමින් හැඳින්වෙන සංස්කෘතිය නිර්මාණය කළ පිරිස ඉරානයේ දී ම මෙම සංකල්පය යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් ලබාගන්නට ඇතැයි සිතිය හැකි ය. එහෙත් මේ පිළිබඳ නිගමනයකට එළඹීමට පෙර ඉරානයේ හා අවට පෙදෙස්වල ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක හැදෑරිය යුතු ය.

කෙසේ වෙතත් දඹදිව භාරතය බවට පත්කළ ආර්යයන්ට පළමුව යක්ෂ ගෝත්‍රිකයන් ඉන්ද්‍ර නමින් දෙවි කෙනකු පුදා ඇති බව නම් පැහැදිලි ය. අජන්තා චිත්‍ර නිර්මාණය වන කාලයේදීත් යක්ෂ ගෝත්‍රිකයන්ගේ ඉන්ද්‍ර දෙවි කෙනකු පැවතී ඇත. බොහෝවිට සිදුවන්නට ඇත්තේ ආර්යයන් යක්ෂ ගෝත්‍රික සංස්කෘතියෙන් යම් යම් දෑ ලබාගෙන පසුව යක්ෂ ගෝත්‍රිකයන්ට ඒ දෑ අහිමි කිරීම ය. ඒ ක්‍රියාදාමයට සියවස් ගණනක් යන්නට ඇත. අවසානයේ දී යක්ෂ ගෝත්‍රිකයන් වෛදික සංස්කෘතියට අවශෝෂණය කිරීමෙන් හා ඔවුන්ට සමාජයේ තැනක් අහිමිකිරීමෙන් මේ ක්‍රියාවලිය අවසන් වන්නට ඇත. ඒ අතර කාලයෙහි යක්ෂ ගෝත්‍රිකයන්ගේ දෙවිවරුන් හුදු මළ යක්ෂයන් නෑ යකුන් ලෙස හඳුන්වන්නට ද වෛදිකයන් පියවර ගෙන ඇති බව පෙනෙයි.

ඉන්ද්‍ර දෙවියන් ද ආර්යයන් දඹදිවට පැමිණීමට පෙර හෝ පසුව හෝ යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් ලබාගත් දෙවි කෙනෙකි ය යන්න පැහැදිලි ය. පැහැදිලි නැත්තේ ඒ සංකල්පය ආර්යයන් දඹදිවට පැමිණීමට පෙර ගත්තේ ද නැත්නම් පසුව ගත්තේ ද යන්න ය. කෙසේ වෙතත් කාලයක්, ඇතැම් විට අවුරුදු දහස් ගණනක් යක්ෂ ගෝත්‍රිකයන්ද වෛදිකයන් ද ඉන්ද්‍ර දෙවියන්ට වැඳුම් පිදුම් කර ඇති බව පෙනෙයි. මේ ඉන්ද්‍ර දෙවියන් වෛදිකයන් අතින් ශක්‍ර දේවේන්ද්‍ර බවට පත්වී ඇත. සිදුහත් කුමරු උත්පත්තිය ලැබූ කාලය වන විට ද ශක්‍ර දේවේන්ද්‍ර යන සංකල්පය වෛදික සංස්කෘතියෙහි තිබී ඇති බව පැහැදිලි ය. ආරෝපිත දෙවි කෙනකු නොව ජීවමාන දෙවි කෙනකු වූ ශක්‍ර දේවේන්ද්‍ර බුදුන් වහන්සේගෙන් බණ අසා බෞද්ධ වන්නට ඇත. ශක්‍ර දේවේන්ද්‍ර සිංහල බෞද්ධයන් අතර සක් දෙවිඳු වී ඇත. යක්ෂයන්ගෙන් වැඳුම් පිදුම් ලැබූ, බොහෝ විට මියගිය යක්ෂ ගෝත්‍රිකයකු විය හැකි, ඉන්ද්‍ර දෙවියන් සිංහල බෞද්ධ දෙවි කෙනකු වූ සක් දෙවිඳු ලෙස විකාශය වන්නට ඇත්තේ එලෙසින් යැයි සිතිය හැකි ය.

මෙහි දී වැදගත් කරුණක් වන්නේ යක්ෂ ගෝත්‍රිකයන්ගේ ඉන්ද්‍ර දෙවියන්, අජන්තා චිත්‍රවල පවා දැක්වෙන යක්ෂ සංස්කෘතියෙහි ඉන්ද්‍ර දෙවියන්, පසුව යක්ෂ ගෝත්‍රිකයන්ට අහිමි කිරීම ය. එහෙත් ඒ අතර වෛදික නොවන සංස්කෘතියක උපත ලැබූ බුද්ධදහම ඉන්ද්‍ර දෙවියන් ශක්‍ර දේවේන්ද්‍රයන් බවට පත්කර වෛදික ඉන්ද්‍ර දෙවියන්ගෙන් වෙන් කර ඇති බව පෙනෙයි. යක්ෂ ගෝත්‍රිකයන්ගේ ඉන්ද්‍ර, වෛදිකයන්ගේ ඉන්ද්‍ර හා අද වන විට සිංහල බෞද්ධයන්ගේ සක් දෙවිඳු එකම තැනැත්තකු වුව ද ඒ ඒ සංස්කෘතිය විසින් ඒ දෙවියන් හඳුනාගනු ලැබ ඇත්තේ එකම අයුරින් නො වේ.

අද සිංහල බෞද්ධයන්ටත් සක් දෙවිඳු සුරයෙකි. මේ සුරයෝ වෛදිකයන්ගේ දෙවිවරු වෙති. එහෙත් සුරයන් නොවන්නනන්ට ද, අසුරයන්ට ද දෙවියන් සිටි බව පැහැදිලි ය. මේ අසුර දෙවිවරු බොහෝවිට ජීවමාන වන්නට ඇත. සුර දෙවියන් අතර ආරෝපිත දෙවියන් ද රාශියක් සිට ඇති බව පෙනෙයි. ඒ ග්‍රීක දෙවිවරුන් මෙනි. ඇතැම් අසුර දෙවිවරුන් කල් යෑමේ දී වෛදිකයන් විසින් සුර දෙවියන් බවට පත්කෙරී ඇත. සක් දෙවිඳු ද එසේ සුර දෙවියකු බවට පත්කෙරුණු අසුර (යක්ෂ ගෝත්‍රිකයන් ද අසුරයන් ලෙස වර්ග කිරීමෙන්) දෙවියෙක් වෙයි. අඩුම තරමින් සක් දෙවිඳු වෛදික නොවන දෙවියෙක් වෙයි.

අද සිංහලයෝ තමන් ආර්යය යැයි සිතති. සිදුහත් කුමරු උපන්නේ ද ආර්ය නොවන සංස්කෘතියක ය. බුදුන් වහන්සේ ලෞකික වශයෙන් ගත්කල වෛදික බමුණු සංස්කෘතියේ අංග විවේචනය කළහ. අර්ධ වෛදිකයන් මෙරටට පැමිණීමට පෙර මෙරට යක්ෂ හා නාග දේව වැනි ගෝත්‍රිකයෝ සිටියහ. අර්ධ වෛදිකයන්ට මුළු රට සම්පූර්ණයෙන් වෛදිකකරණයකට ලක්කිරීමට නොහැකි විය. විශේෂයෙන් ම බුද්ධදහම හේතුකොටගෙන එසේ කිරීම අපහසු වූයේ බුද්ධදහම වෛදික සංස්කෘතියක උපත නොලැබූ බැවිනි. එහෙත් ඉතිහාසයෙහි මහාවංසය ලියැවුණු සමය වන විට, එනම් පස්වැනි සියවස පමණ වන විට, සිංහලයන් තමන් ආර්යයන් බවට පිළිගෙන ඇත.

© Prof. Nalin De Silva

මේ මතය පළමුව ඇතිවූයේ උගතුන් අතර විය යුතු ය. භාරතයෙන්, විශේෂයෙන් ම ආන්ධ්‍ර ප්‍රදේශයෙන් ථෙරවාදය නැතිවීමත් සමග ථෙරවාදය ආරක්‍ෂාකිරීම සඳහා සිංහල භික්‍ෂූන් වහන්සේ උත්තර භාරතයට වඩා නැඹුරු වූවා විය හැකි ය. එහෙත් එහි දී ප්‍රශ්නය වනුයේ එවකට උත්තර භාරතයේත් ථෙරවාදයක් නො තිබීම ය. ඇතැම් විට එසේ නොතිබීම ම එයට හේතුවක් වන්නට ද ඇත. ලංකාවේ බුද්ධදහමට එරෙහි වූවෝ යක්‍ෂ ගෝත්‍රිකයෝ ය. එමෙන් ම පස්වැනි සියවස පමණ වන විට ලංකාවට දේශපාලනික වශයෙන් තර්ජනය එල්ල වූයේ දක්‍ෂිණ භාරතයෙනි. දක්‍ෂිණ භාරතීය සංස්කෘතියට මෙන් ම යක්‍ෂ සංස්කෘතියට ද විරුද්ධ සංස්කෘතියක් වූයේ බෞද්ධ නොවුවත් උත්තර භාරතීය සංස්කෘතිය ය.

දක්‍ෂිණ භාරතයට හා යක්‍ෂ ගෝත්‍රිකයන්ට එරෙහිව, බුද්ධදහමක් නැති නමුත්, දේශපාලනික හෝ සංස්කෘතික හෝ (එකල ආර්ථික හේතු එතරම් වැදගත් නොවූ බව මාක්ස්වාදීන්ට අමතක වෙයි) පිහිටක් නැති නමුත් ආධ්‍යාත්මික වශයෙන් මෙරට භික්‍ෂූන් වහන්සේ උත්තර භාරතයට හා ආර්ය සංස්කෘතියට නැඹුරු වූහ යන නිගමනයට එළඹීමට අපට සිද්ධවෙයි. මේ ආර්ය නැඹුරුව හේතුවෙන් අපට අපේ යක්‍ෂ සංස්කෘතියෙහි ඇතැම් දෑ අහිමි වී ගොස් ඇති බව පැහැදිලි ය. වෙනත් වචනවලින් කිවහොත් අපේ ඉතිහාසය අප හදාරන්නේ යක්‍ෂ සංස්කෘතියෙන් හා අදාළ ඉතිහාසයෙන් බැහැර වෙමිනි. නැතහොත් යක්‍ෂ සංස්කෘතියට හිමිවිය යුතු තැන අහිමි කිරීමෙනි. සීගිරිය සම්බන්ධයෙන් අපි දැනටමත් මේ පිලිබඳ ව සාකච්ඡා කර ඇත්තෙමු. මෙරට යක්‍ෂ ගෝත්‍රිකයන්ගේ ඉන්ද්‍ර දෙවියන් ඇත්තේ කොහේ ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva